# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳව පවතින ආකල්ප (බලංගොඩ හා හලාවත ප්‍රදේශ ආශ්‍රයෙන්)

ඊ.පී.ඩී.එන්.එදිරිසිංහ, එම්.එම්.ඒ.එස්.ගුණසේකර*

වර්තමානය වනවිට ලෝකයේ සංචාරක ව්‍යාපාරයට අවතීර්ණ වී නොමැති රටක් ඇත්නම් ඒ කලාතුරකිනි. මෙය රටකට විදේශ විනිමය හා ආදායම් ඉපයීමේ කර්මාන්තයක් වශයෙන් ද රැකියා උත්පාදනය කිරීමේ කර්මාන්තයක් වශයෙන් ද හඳුනාගත හැකිය. වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති හලාවත දෙස් විදෙස් සංචාරකයින් නිරතුරුවම සංචාරය කරන ප්‍රදේශයක් ලෙස සැලකිය හැකිය. හලාවත ප්‍රදේශයෙහි මුහුදු තීරයත්, මුහුදු මාළුවලට වඩාත් ප්‍රචලිත නිසාත් බොහෝ සංචාරකයින් නිවාඩුවට විවේකීව කාලය ගත කිරීමට හලාවත තෝරා ගන්නා බව නොරහසකි. සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි බලංගොඩ ප්‍රදේශය ඓතිහාසික හා සංස්කෘතික වශයෙන් වැදගත් වන්නා වූ ද පුරාවිද්‍යාත්මක සාධක රැසක් හමුවන ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. භූගෝලීය වශයෙන් මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ද විශාල වෙනස්කම් දක්නට ලැබෙන මෙම ප්‍රදේශවල වෙසෙන ජනයා සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් දරන ආකල්පයන් පිළිබඳව ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම, සහභාගීත්ව නිරීක්ෂණ හා ක්ෂේත්‍ර පරීක්ෂණ ආදිය ඇසුරින් විශ්ලේෂණාතමක අධ්‍යයනයක් කිරීම මෙහි අරමුණ වේ. මෙමගින් ලැබෙන දත්තයන් විශ්ලේෂණය මගින් මෙම ප්‍රදේශවල වෙසෙන ජනයා සංචාරක කර්මාන්තය පිළිබඳ දරන ආකල්පයන් හඳුනාගැනීම හා එය සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට දායක කර ගැනීමට අපේක්ෂා කෙරේ.

මුඛ්‍ය පද : සංචාරක කර්මාන්තය , ආකල්ප , බලංගොඩ , හලාවත , විදේශ විනිමය

* dilininelu94@gmail.com / asgunasekara00@gmail.com